**මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) -2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගමේ ("සමාගම")හි 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 202I දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ ඒදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | සමාගමේ ලෙජර් ගිණුම්වල ගිණුම් කේත අංක දක්වා නොමැත. තවද ගණුදෙනුවල ගෙවීම් වවුචර් හෝ වෙනත් මූලාශ්‍ර ලේඛන වැනි මූලාශ්‍ර ලේඛන අතර සම්බන්ධතාවයද දක්වා නොමැත | මෙම තොරතුරු ගිණුම්කරණ පද්ධතිය තුළ ඇතුළත්ව ඇති නමුත් මුද්‍රණය කළ ලෙජර ගිණුම්වල ඇතුළත්ව නැත. මෙම තත්වය ගිණුම්කරණ මෘදුකාංගය වැඩිදියුණු කළ සමාගමට දන්වන ලද අතර එය ඉතා ඉක්මණින් නිවැරදි කිරීමට ඔවුන් එකඟ විය. | පරිශීලක අවශ්‍යතාවය අනුව පරිගණක පද්ධතිය සකස් කිරීමට කළමනාකාරීත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු අතර ගනුදෙනුවක මූලාශ්‍ර ලේඛනය සහ ගිණුම්කරණ පද්ධතිය අතර පැහැදිලි සම්බන්ධතාවයක් පැවතිය යුතුය. |
| ආ | අනුමත කරන ලද ජ'නල් සටහන්වල සාරාංශයක් සමාගම විසින් සපයන ලදී. කෙසේ වුවද, සංලක්ෂය සහ අදාළ උපයෝගී ලේඛන සහිත ජ'නල් වවුචර භෞතිකව සපයා නොමැත. | සියලු ජ'නල් සටහන් ගිණුම්කරණ පද්ධතිය මගින් ඇතුළත් කර ඇති අතර ඒවා මාසිකව මුද්‍රිත පිටපත් ලෙස ලබාගෙන නොමැත. වැටුප් සාරාංශ ජ'නල් සටහන් සඳහා උපකාරක ලියවිලි ලෙස යොදාගෙන ඇති අතර එක් එක් ජනල් සටහන් සඳහා සංලක්ෂයන් යෙදීමට පියවර ගනු ඇත. | කළමනාකරණය විසින් ජ'නල් සටහන් සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුයි. |
| ඇ | සමාගම විසින් සියලුම ගෙවීම් සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ (මව් සමාගම) ගෙවීම් වවුචර උපයෝගී කර ගනිමිනි. එම නිසා අනුක්‍රමික අංක පිළිවෙළට වවුචර් නිකුත් කිරීම පිළිබඳව විගණනය වෙත අනාවරණය නොවීය. ස්වාධීන සමාගමක් වශයෙන් වවුචර පිළියෙල කර ගෙවීම් සිදු කිරීමේ ක්රමවේදයක් සමාගම තුළ ස්ථාපනය කර නැත. | 2022 වර්ෂයේ සිට සමාගම සඳහා ගෙවීමේ වවුචර හඳුන්වාදීමට කටයුතු කරනු ඇත. | කළමනාකාරීත්වය විසින් සමාගමට අනන්‍යවූ ගෙවීම් වවුචර සහිත ගෙවීම් පද්ධතියක් සහ ක්‍රියාකාරී අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |
| ඇ | සමාගමේ සේවකයින්ට ලබාදෙනු ලබන ණය පහසුකම් සහ එහි අයකර ගැනීම් සමාගමේ පොත්වල සටහන් කර නොතිබුණි. ඒ වෙනුවට එම ශේෂයන් මව් සමාගමේ පොත්වල සටහන් කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල ණය ශේෂය රු. 46,379,431 ක් ලෙස දැක්වේ. | ණය ලෙජරයක් පවත්වාගෙන යාම දැනටමත් ආරම්භ කර ඇත. | සේවකයන්ට ලබාදෙන ණය පහසුකම සේවක ප්‍රතිලාභවල කොටසකි. මේ නිසා සේවකයින්ට ලබාදෙන ණය සම්බන්ධව ලේඛන සමාගම විසින් පවත්වාගෙන යායුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග ඇති ජංගම ගිණුම | රු.153,395,391 | රු.152,798,293 | රු.597,098 | ගිණුම් අතර සංසන්දනය දැනටමත් ලබාදී ඇත. | කළමනාකරණය විසින් මෙකී වෙනස්වීම් සඳහා හේතු හඳුනාගෙන කාලඡේදයන්ට අනුකූලව ඒවා නිවැරදි කිරීමට කටයුතු කළයුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| අ | වෛද්‍ය නිවාඩු සඳහා දීමනා ගෙවීම | රු. 24,149,399 | ගෙවීම් කිරීම සඳහා අනුමත කරනලද ආයතනික ප්‍රතිපත්තියක් හෝ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් | මෙය ආරම්භයේ සිටම සමාගමේ පරිචයක් ලෙස ක්‍රියාත්මක වූවකි. | කළමනාකරණය විසින් මේ සඳහා නියමිත ප්‍රතිපත්තියක් සකස්කර අදාළ පරිදි අධිකාරී බලය ලබාගැනීමට කටයුතු කළයුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | ලැබිය යුතු වැට්බදු ලෙස රු. 218,482 ක ශේෂයක් 2019 වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් ඇත. සමාගම විසින් එම ශේෂය හඳුනාගෙන නැවත අයකරගැනීමට කටයුතු කර නොතිබුනි. | ගෙවිය යුතු වැට් බදු සහ වැට්බදු ආදාන වටිනාකම අතර ගැළපීමකින් මෙම ශේෂය හටගෙන තිබේ. මෙය ගිණුම්කරණ දෝෂයකි. මෙය නිසි සාධාරණීකරණයක් සහිතව ලබන වසරේදී ගැළපීමට කටයුතු කරනු ඇත. | කළමනාකරණය විසින් මෙම ශේෂයන් හඳුනාගැනීමට සහ ආපසු අයකරගැනීමට නිසි ක්‍රියාමාර්ග ගතයුතුයි. |
| ආ | 2020 අංක 04 දරන ආර්ථික සහ සේවා ගාස්තු (සංශෝධන) පනත අනුව ආර්ථික සහ සේවා ගාස්තු අයකිරීම 2020 ජනවාරි මස 01 දින සිට අත්හිටුවා ඇත. නමුත් 2021 දෙසැම්බර් 31 දින වනවිට නැවත අයකරගැනීම සඳහා සුදුසු පියවර ගැනීමට අපොහොසත් වූ රු. 4,346,862 ක ආර්ථික සේවා ගාස්තු වටිනාකමක් ගිණුම්වල නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් යොදා තිබූ ජනල් සටහන මගින් සිදුවූ බලපෑම නිවැරදි කිරීමට කටයුතු කරන අතර නැවත ජනල් සටහන් යෙදීමට පෙර නිසි අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ඇත. | කළමනාකරණය විසින් මෙම ශේෂයන් ආපසු අයකරගැනීමට නිසි ක්‍රියාමාර්ග ගතයුතුයි |

**1.6.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ | 1935 වෘත්තීය සමිති ආඥා පනතේ 8(1) සහ 8(2) වගන්ති සමග කියවිය යුතු 1935.10.25 දිනැති අංක 8160 දරන ගැසට්පත්‍රය | විධායක වැටුප් ගෙවීම සඳහා වන සාමූහික ගිවිසුමේ පාර්ශවකරුවන් වී ඇති වෘත්තීය සමිති 6ක්, නියමිත පරිදි වලංගු ලියාපදිංචියක් සහිත, ක්‍රියාකාරී වෘත්තීය සමිති බවට තහවුරු කිරීම සඳහා වන,0 කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් වී නොමැත. | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වගකිවයුතු නිලධාරීන් වෙත දැනටමත් යොමු කර ඇත. | සාමූහික ගිවිසුමට එළඹීමට පෙර අදාළ වෘත්තීය සමිති ක්‍රියාකාරී සහ වලංගු වෘත්තීය සමිති දැයි පරීක්ෂා කළ යුතුයි. |

**1.6.3 මුදල් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | ආයතනය සතුව ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක රුපියල් 356,677 ක ශේෂයක් පවතින අතර මෙම බැංකු ගිණුම 2018 වර්ෂයේ සිට කිසිදු ක්‍රියාකාරී ගණුදෙනුවක් සඳහා භාවිතා කර නොමැත | මෙම ගිණුම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙනුවෙන් සපයනු ලබන සේවාව සඳහා ඇතිකරන ලද්දකි. ඉදිරියේදී මැනේජ්මන්ට් සවිසස් රක්ෂණ පෞද්ගලික සමාගම වෙත නව ගිණුම් නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරන අතර එවිට මෙම ගිණුම මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කිරීමට අපේක්ෂිතයි. | මෙම බැංකු ගිණුම පවත්වාගෙන යාමේ අරමුණ නැවත සමාලෝචනය කර එම ගිණුම පවත්වාගෙන යාමට හෝ අවලංගු කිරීමට කටයුතු කළයුතුය. |
| ආ | 2018 වර්ෂයේ සිට රු. 1,000,000 ක වටිනාකමින් යුතු ස්ථාවර තැන්පතුවක් ආයතනය සතුව පවතින අතර 2021 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු. 1,282,857කි. මෙම සමාගමේ අරමුණු සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය අනුව, මෙම ස්ථාවර තැන්පතුව පවත්වාගෙන යාමට සාධාරණ හේතුවක් ආයතනය සතුව නොතිබුනි. | මෙම ගිණුම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙනුවෙන් සපයනුලබන සේවාව සඳහා ඇතිකරන ලද්දකි. ඉදිරියේදී මැනේජ්මන්ට සවිසස් රක්ෂණ පෞද්ගලික සමාගම වෙත නව ගිණුම් නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරන අතර එවිට ගෙවීම් කටයුතු මෙම සමාගම මගින්ම සිදුකිරීමට සැලසුම් කරන බැවින් මෙම අරමුදල මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කිරීමට අපේක්ෂිතයි. | මෙම ස්ථාවර තැන්පතුව පවත්වාගෙන යාමේ අරමුණ නැවත සමාලෝචනය කර එම තැන්පතුව පවත්වා ගෙන යාමට හෝ අවලංගු කිරීමට කටයුතු කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ පෞද්ගලික සමාගම විසින් දරන ලද සියලුම වියදම් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ප්‍රතිපූරණය කර ඇත. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා කිසිදු ලාභයක් හෝ අලාභයක් හඳුනාගෙන නොතිබුණි. සාංගමික ව්‍යවස්ථාවලිය අනුව පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගම පිහිටුවා ඇත.

- රක්ෂණ කළමනාකරණය සහ තාක්ෂණික සේවා සැපයීම සඳහා
- රක්ෂණ සහ උපදේශන සේවා සැපයීම සඳහා
- රක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන සේවා සැපයීම සඳහා
- සාමාන්‍ය කළමනාකරණ සහ උපදේශන සේවා සැපයීම සඳහා

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ගිණුම් අයිතමය | වටිනාකම | | විචලනය | | වර්ධනය/ පසුබෑම | |
|---|---|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 | 2021 | 2020 |
| | රු . 000 | රු . 000 | රු . 00 | රු . 000 | % | % |
| කළමනාකරණ ගාස්තු | 739,905 | 700,922 | 38,983 | 117,370 | 5.6% | 20% |
| වැටුප් | 304,247 | 293,090 | 11,157 | 48,323 | 3.8% | 20% |
| සමස්ත කාර්ය මණ්ඩල වියදම | 729,351 | 693,751 | 35,600 | 119,792 | 5.1% | 21% |
| සේවක සංඛ්‍යාව | 85 | 80 | 05 | 10 | 6.25% | 14% |

### 2.3 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | 2021 | 2020 | 2019 |
|---|---|---|---|
| | රු . | රු . | රු . |
| මසක කාලසීමාවකට සේවකයෙක් වෙනුවෙන් වියදම | 715,148 | 722,658 | 683,284 |
| කාර්ය මණ්ඩල වියදම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ දළ ලිඛිත වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 1.69% | 1.76% | 1.70% |
| කාර්ය මණ්ඩල වියදම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික ශුද්ධ ලාභයේ ප්‍රතිශතයක් ලෙස | 7.26% | 11.98% | 8.17% |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ආයතනයේ අරමුණු ඉටුකරගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ දැක්වෙන, පහත සඳහන් අරමුණු ඉටුකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග, සමාගම විසින් ගෙන නොමැත.<br>- රක්ෂණ කළමනාකරණය සහ තාක්ෂණික සේවා සැපයීමට<br>- රක්ෂණ උපදෙස් ලබාදීම සහ උපදේශන සේවා සැපයීම<br>- රක්ෂණය පර්යේෂණ සහ සංවර්ධන සේවා සැපයීම | මැනේජ්මන්ට් සර්විසස් (රක්ෂණ) සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට කළමනාකරණය සැලසුම් කරමින් සිටින අතර ඒ අනුව මෙම අරමුණු නව ව්‍යුහය යටතේ සාකච්ඡා කෙරේ | කළමනාකාරීත්වය විසින් සමාගමේ අරමුණු ඉටු කරගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | සමාගමේ එක් අරමුණක් වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා බඳවාගැනීම සහ යොමු කිරීමයි. කෙසේවෙතත් සමාගම විසින් බඳවා ගැනීමට අවශ්‍ය ප්‍රධාන කළමනාකාර තනතුරු සමාගම විසින් හඳුනාගෙන නොතිබුනි. තවද සමාගමේ සංවිධාන ව්‍යුහය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමාගමේ සංවිධාන ව්‍යුහය සකස් කර ඇති අතර, විගණනයට ඉදිරිපත් කෙරෙනු ඇත. | සමාගම හරහා බඳවාගැනීමට සහ යොමු කිරීමට අවශ්‍ය ප්‍රධාන කළමනාකරණ තනතුරු සමාගම විසින් හඳුනාගත යුතුයි. |
| ආ | 2021 දෙසැම්බර් 31 වන දින වනවිට සමාගමේ සේවක සංඛ්‍යාව 85 කි. නමුත් ඉන් රැකියා විස්තර සපයා තිබුනේ සේවකයන් 26 දෙනෙක් සඳහා පමණි. සේවකයන් 59 දෙනෙක් සඳහා රැකියා විස්තර සපයා නොතිබුනි. | මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඔවුන් සෑම සේවකයෙකුටම රැකියා විස්තරය සපයා ඇති බවට තහවුරු කරන අතර, එම රැකියා විස්තරයන්ගේ පිටපත් පෞද්ගලික ලිපිගොනුවලට ඇතුළත් කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට කටයුතු කරනු ඇත. | සමාගම විසින් එක් එක් සේවකයාගේ භූමිකාවන් සහ වගකීම් හඳුනාගෙන සියලුම නිලධාරීන්ට රැකියා විස්තර නිකුත් කළ යුතුයි |
| ඇ | සමාගම විසින් 2021 වර්ෂය සඳහා බඳවා ගැනීමේ සැලැස්මක් පිළියෙල කර නොමැත. තවද වර්ෂය තුළ කළමනාකරණ තනතුරු පහක් පුරප්පාඩුව පැවති අතර දෙදෙනෙක් සේවයෙන් ඉල්ලා අස්වී ඇත. තවද නිලධාරීන් දාහත්දෙනෙක් 2021 වර්ෂයතුළ දී බඳවාගෙන ඇත. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ උපායමාර්ගික සැලසුම් සහ ව්‍යාපාරික අවශ්‍යතා මත බඳවාගැනීම් සිදු කරයි. | සමාගම සතුව නියමිත බඳවාගැනීමේ සැලැස්මක් පැවතිය යුතුයි. |

**3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**3.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇත. නමුත් අභ්‍යන්තර විගණන වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | එහි කටයුතු අවසන් වූ පසු විගණන වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ | අභ්‍යන්තර විගණන වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය. |